# සියලුම දේශපාලන පක්ෂ පරාජිත මන්ත්‍රීවරුන්ගෙන් ජාතික ලැයිස්තු පුරවලා

## නව නීති නිර්ණායක සැකසීමට කාලය ඇවිත්

### පැෆරල් සංවිධානය

උදේනි සමන් කුමාර

ජාතික ලැයිස්තුව හඳුන්වාදීමේ මූලික අරමුණු නොසලකා හරිමින් සියලුම දේශපාලන පක්ෂ දේශපාලන අරමුණු මත ජාතික ලැයිස්තු පිරවීමට කටයුතු කර ඇති බව පෙන්වා දෙන "පැෆරල් සංවිධානය" ජාතික ලැයිස්තු පිරවීමට අදාළ නව නීති නිර්ණායක සකස් කිරීමට කාලය එළැඹ තිබේ යැයි පවසයි.

නියෝජනයක් නොලබන කණ්ඩායම්වලට නියෝජනයක් ලබාදීමත් නීති ප්‍රතිපත්ති සම්පාදනයට විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණතාව ඇති බුද්ධිමතුන් සම්බන්ධ කර ගැනීමත් ජාතික ලැයිස්තුව හඳුන්වා දීමේ අරමුණ බව එම සංවිධානය පෙන්වා දෙයි.

එහෙත් මෙවර මැතිවරණයෙන් පසු ජාතික ලැයිස්තුව පරාජිත අපේක්ෂකයන් පාර්ලිමේන්තුවට ගැනීමට යොදා ගෙන තිබීම නිසා ජනතාව ප්‍රතික්ෂේප කළ පිරිස එසේ පාර්ලිමේන්තුවට එනවා නම් මැතිවරණ කුමකටද යන සංවාදය රට තුළ ඇතිව තිබෙන බවද "පැෆරල්" නිවේදනයේ සඳහන් වේ.

මැතිවරණයේදී ජනතා තීන්දුවට බලපෑ දේශපාලනික හේතු මෙන්ම කාන්තා නියෝජනය අවම වීමට බලපෑ කරුණුද සැලකිල්ලට ගනිමින් සුවිශේෂිත හේතු මත පරාජිත අපේක්ෂකයන් ගැනීමට සිදු වන්නේ නම් ඒ සඳහා විශේෂ නිර්ණායක සකස් කරන ලෙස පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා නව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටී.